# යුරෝපා ඉතිහාසය

## 1.1 නූතන යුරෝපය උදා වූ ආකාරය පැහැදිලි කරයි.

( අභ්‍යාස )



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

අභ්‍යාස

- පහත ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

1). ග්‍රීක ශිෂ්ටාචාරය ආරම්භ වන්නේ කුමන ප්‍රදේශවලින් ද?

i) ආසියානු
ii) සුළු ආසියානු
iii) මධ්‍යධරණී ප්‍රදේශය
iv) ඇමරිකානු
v) මධ්‍ය ආසියානු ( ............. )

2).ඇතැන්ස් රාජ්‍යයට අධිපති දෙවියා ලෙස සලකන්නේ කවුරුන් ද?

i) සියුස්
ii) ඇතිනා දෙවඟන
iii) හෙරානා
iv) ඇපලෝ
v) ඒරාස් ( ............. )

අංක 03 සිට 04 දක්වා ප්‍රශ්නවල එක් මාතෘකාවක් යටතේ කරුණු 05ක් දක්වා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. නොගැළපෙන කරුණ තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.

3).ග්‍රීක ශිෂ්ටාචාරයට අයත් නගර

i) ට්‍රෝයි
ii) සාඩිස්
iii) පෙස්ටන්
iv) මදීනා
v) මයිසිනියා ( ............. )

4).ග්‍රීක ශිෂ්ටාචාරය තුළ සිටි දාර්ශනිකයන්

i) ප්ලේටෝ
ii) ඇරිස්ටෝටල්
iii) හෙරඩෝටස්
iv) ජස්ටිනියන්
v) ඇරිස්ටාකස් ( ............. )

අංක 05 සිට 06 දක්වා ප්‍රශ්නවල නාම පද පහ බැගින් දක්වා ඇත. ඒවායින් කුමන හේතුවක් නිසා හෝ නොගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය තිත් ඉරි මත ලියන්න.

5). i) ඉලියඩ්
ii) ඔඩෙසි
iii) වැඩ හා දවස්
iv) ඊනිඩ්
v) නියුසිඩිසිස් ( ............. )

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

6). i) හර්කියුලිස්
ii) ඒරස්
iii) වාර්ස්
iv) ඇපලෝ
v) සියුස් ( ............. )

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1)
i) ග්‍රීසියේ බිහි වූ ප්‍රබලතම පෞර රාජ්‍ය තුනක් නම් කරන්න. (ලකුණු 03)
ii) පෞර රාජ්‍යවල ප්‍රධාන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 04)
iii) ග්‍රීක ශිෂ්ටාචාරයේ පැවැති අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ 2 ක් පැහැදිලි කරන්න. (ලකුණු 07)

2)
i) ග්‍රීක ශිෂ්ටාචාරයේ මූර්ති කලාව තුළ දක්නට ලැබුණු විශිෂ්ට ප්‍රතිමා දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii) ග්‍රීක් ශිෂ්ටාචාරයේ පැවැති ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 04)
iii) වර්තමාන සමාජය හැඩගැස්වීමෙහිලාත්, ප්‍රයෝජනවත් අදහස් හා චින්තන ග්‍රීක ශිෂ්ටාචාරයේ දක්නට තිබුණි. දාර්ශනිකයන් දෙදෙනකුගේ අදහස් මඟින් කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 08)

**පැවරුම**

ග්‍රීක ශිෂ්ටාචාරය පිළිබඳව පිංතූර හා රූප සටහන් භාවිතයෙන් වාර්තාවක් සකස් කරන්න.එම වාර්තාවට පහත කරුණු ආශ්‍රිත ඡායාරූප එකතු කර ඇතුළු කරන්න.

- ග්‍රීසියේ භූගෝලීය පිහිටීම
- පෞර රාජ්‍ය
- ආර්ථික කටයුතු.
- අධ්‍යාපන කටයුතු.
- දාර්ශනික චින්තකයන්
- ආගමික විශ්වාස
- ක්‍රීඩා
- කලා නිර්මාණ
  සාහිත්‍ය නිර්මාණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. ලෝක ඉතිහාසය B .V රාවෝ - අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන
2. ඉපැරණි ලෝක ශිෂ්ටාචාර - අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන
3. ඉතිහාසය ගුරු මාර්ගෝපදේශය (12 ශ්‍රේණිය)


අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරී මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
සැකසුම :- ටි.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.

Copyright © www.e-thaksalawa.moe.gov.lk